# ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය

**ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය**

**මෙම ආයතනය 2007 අංක 26 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත අර්ධ රාජ්‍ය ආයතනයක් වන අතර, එහි පුරප්පාඩු වී ඇති පහත තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. අධ්‍යක්ෂ (අධ්‍යාපන හා පුහුණු) - තනතුරු 01 (අගලවත්ත පුහුණු ආයතනය සඳහා)

**කාර්යයන්** : ආයතනය පිහිටුවීමට අදාළ ඉහත සඳහන් පනත මගින් ආයතනය වෙත පවරනු ලැබූ කාර්යයන්ගෙන් ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියා විසින් ඉටු කළ යුතු කාර්යයන් අතුරින් තනතුරු ගතව සුවිශේෂී කොට පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ හා විධායක කාර්යයන් අයත් වේ.

**පත්වීමේ ස්වභාවය** : ස්ථිර තනතුරකි. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිවේ.

**වැටුප් පරිමාණය** : HM 1-1-2016 රු. 80,295/= 15X2270 - රු. 114,345/= (2018 වසර සඳහා වැටුප රු. 63,589/= කි)

**සුදුසුකම් :**

✳ **බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ හෝ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා විෂයයන්ට අදාළව හෝ රාජ්‍ය පරිපාලන / මූල්‍ය /ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය/ අධ්‍යාපන පරිපාලනය හෝ නීතිය පිළිබඳ දෙවන පෙළ උපාධියක් සමග ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් ද අවුරුදු පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද** : ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනයක කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම සහ මෙම වසර 12 න් අවම වශයෙන් වසර 03 ක් පශ්චාත් උපාධි සුදුසුකම් ලබාගැනීමෙන් පසුව විය යුතුය.

**අතිරේක සුදුසුකම්**

I. දෙවන භාෂාව හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණත්වයක් ලබා තිබීම.

II. තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

✳ **අභ්‍යන්තර අයදුම්කරුවන්**

I. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම, හෝ

II. ආයතනයේ කළමනාකරණ සේවා ගණයේ I ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් හා අධ්‍යයන හා පර්යේෂණ සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු ලෙස වසර 08 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ / ශ්‍රී ලංකා සැලසුම් සේවයේ/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පළමු පන්තියේ නිලධාරියෙකු තම් ද්විතීයික පදනම මත බඳවා ගැනීමට හැකියාව ඇත.

**වයස** : අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සහ දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය/ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

## 02. තනතුර - අධ්‍යයන හා පර්යේෂණ නිලධාරී

**ප්‍රධාන කාර්යයන් :**

✳ සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාවන්ට අදාළව ඉගැන්වීමේ කටයුතු

✳ භාෂා ඉගැන්වීම සම්බන්ධව පර්යේෂණ පවත්වා නිර්දේශ ඉදිරිපත් කිරීම.

✳ පුහුණු වැඩසටහන් පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයන් පැවැත්වීම.

**වැටුප් පරිමාණය :** AR1-2016 රු. 53,150/= 10X1375 - 5X645 - 15X1910 - රු. 95,550/=

**සුදුසුකම්**

✳ **බාහිර අයදුම්කරුවන්**

**අධ්‍යාපන සුදුසුකම් :**

✳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අධ්‍යාපන ක්ෂේත්‍රය හෝ සංඛ්‍යානය හෝ භාෂා හෝ පර්යේෂණ හෝ සමාජ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් පළමු පෙළ හෝ දෙවන පෙළ සාමාර්ථයක් සහිතව උපාධියක් ලබා තිබීම හෝ

✳ ඉහත සඳහන් විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමග එම විෂය ක්ෂේත්‍රයකින් ද අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**අතිරේක සුදුසුකම්**

✳ ඉංග්‍රීසි භාෂාව භාවිතා කිරීම පිළිබඳ නිපුණතාවය

✳ තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

**වයස** : අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

## 03. සම්බන්ධීකරණ සහකාර - තනතුරු 02

**කාර්යයන්** : ආයතනය පිහිටුවීමට අදාළ 2007 අංක 26 දරන ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතන පනත මගින් ආයතනය වෙත පැවරී ඇති කාර්යයන් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා දිවයින පුරා භාෂා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ පසු විපරම් කිරීම.

**වැටුප් පරිමාණය** : MA 3-2016 රු. 32,200 - 10X445 - 11X660 - 10X730- 5X750 = රු. 54,960/=
(2018 වසර සඳහා වැටුප රු. 25,560/= සහ ගැලපීමේ දීමනාව රු. 3,160)

**අධ්‍යාපන සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් තිබීම.

**අමතර සුදුසුකම් :**

I. තනතුරට බඳවා ගනු ලැබූ මාධ්‍යයට අමතර, සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඉහළ ප්‍රවීණත්වයක් ලබා තිබීම.

II. තොරතුරු තාක්ෂණය පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

වයස අවුරුදු 21 ට නොඅඩු සහ 35 ට නොවැඩි අය විය යුතුයි. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

## 04. රියදුරු තනතුරු 01

**කාර්යයන් :**

✳ ආයතනය සතු පවරා ඇති වාහන පැදවීම

✳ වාහන නඩත්තු කිරීම

✳ ධාවන සටහන් පොත් පවත්වාගෙන යෑම

✳ වාහනවල සුළු අලුත්වැඩියා කටයුතු කිරීම

✳ වාහනවල ආරක්ෂාව පිළිබඳ වගකීම

✳ ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන තනතුරට අදාළ වෙනත් කාර්යයන්

**වැටුප් පරිමාණය** : PL3 - 2016 රු. 26,290/=10X270 - 10X300 - 10X330 - 12X350 - රු. 39,490/= (2018 වසර සඳහා වැටුප රු. 20,842/= සහ ගැලපීමේ දීමනාව රු. 4,479/=)

**අධ්‍යාපන සුදුසුකම්**

✳ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී විෂයයන් හයකින් සමත්වීම සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් රථ වාහන පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ බලපත්‍රයක් ලබාගැනීමෙන් පසු වසර 03 ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන් උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.)

**සියලු තනතුරු සඳහා පොදු කරුණු :**

**සෑම අපේක්ෂකයෙක්ම :**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති වියයුතු අතර, ඒ සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු පිළිවෙල :**

ජීවදත්ත විස්තර හා ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, දුරකථන අංක සහ තැපැල් ලිපිනයන්, විද්‍යුත් තැපැල් ලිපිනයන් ඇතුළත් තමන් විසින් සකස් කළ අයදුම්පත්‍රය, අධ්‍යාපන / වෘත්තීය සහතික පිටපත් සමග 2018 සැප්තැම්බර් මස 03 වන දින හෝ එදිනට පෙර පහත සඳහන් ලිපිනය වෙත එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළ යුතුය. දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය/ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනය,**
**අංක 40 බුත්ගමුව පාර, රාජගිරිය.**